# ප්‍රසම්පාදන දැන්වීමයි

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව - සබරගමුව පළාත් සභාව

01. පහත සදහන් වැඩ විෂය සදහා වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2024.10.30 වන දින පෙ.ව. 11.00 දක්වා ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාර ගැනේ.

| අනු අංකය | වැඩ විෂයය | දළ ඇස්තමේන්තු වැඩ වටිනාකම (රු.මි) | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු (රු) | ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරය (රු) | කොන්ත්‍රාත් ලියාපදිංචි වටිනාකම |
|---|---|---|---|---|---|
| 1. | පූර්ව ළමාවිය සංවර්ධනය හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම | 11.8 | 5,000.00 | 118,000.00 | C5/C6 |

02. මෙම ලංසු කැදවීම විවෘත තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය යටතේ සිදුකරනු ලබන අතර, මෙම කර්මාන්තය රු.මි. 50 ට වඩා අඩු බැවින් රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 04/2006(II) හා 04/2016(III) අනුව ප්‍රාදේශීය ප්‍රමුඛතා හා අදාල (CIDA) ශ්‍රේණිගත ප්‍රමුඛතාවය පදනම් කර ගනිමින් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ලංසුකරුවකු තෝරා ගැනීම සිදුකරනු ලැබේ. එම චක්‍රලේඛයට අදාලව පසුව නිකුත් කරන ලද රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 03/2020 හා 03/2020(I) හා 04 /2016(iv) යන චක්‍රලේඛයන්ද ප්‍රසම්පාදන කටයුතු සඳහා අදාල වේ.

03. 2024.10.15 දින සිට 2024.10.29 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඉහත සඳහන් පරිදි ගාස්තු ගෙවීමෙන් වැලිගෙපොල ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලංසු ලේඛන ලබාගත හැකිය.

04. සියළුම ලංසුකරුවන් මෙම කර්මාන්තය සඳහා ඉහත සඳහන් ලංසු බැඳුම්කර වටිනාකමට අදාලව ලංසුබැඳුම්කර වශයෙන් පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු බැඳුම්කරයක් 2024.10.30 දින සිට 2025.02.29 දින දක්වා වලංගු වන පරිදි "ලේකම්, ප්‍රාදේශීය සභාව, වැලිගෙපොල" ප්‍රතිලාභියා ලෙස නම් කර ලබා ගත් ලංසු බැඳුම්කරයක් මගින් හෝ අදාල කර්මාන්තය නමින් ලංසු සුරක්ෂණ මුදල ලෙස ප්‍රාදේශීය සභාවේ අදාල මුදල් තැන්පත් කර ලබාගත් රිසිට්පත ලංසු ලේඛන සමග ඉදිරිපත් කල යුතුය.

05. මෙම කර්මාන්තය පිළිබඳ විස්තර වැලිගෙපොල ප්‍රාදේශීය සභාව වෙත පැමිණ හෝ දුරකථන අංක 045-2270410 වෙතින් කාර්යාල වේලාවන් තුලදී ලබා ගත හැකිය. අවශ්‍යය අයෙකුට සතියේ වැඩකරන දිනයන්හිදී නොමිලේ ලංසු ලේඛන පරීක්ෂාකර බැලිය හැකිය.

06. ලංසු ලේඛණ වල මුල් පිටපත් අනුපිටපත්, වෙන වෙනම කවරවල බහා එක් එක් කවරයේ ඉහළ වම් කෙළවරේ මුල් පිටපත අනු පිටපත ලෙස සඳහන් කර, මුද්‍රා තබන ලද කවර දෙකම එක් කවරයක බහා එහි ඉහළ වම් කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කර ඉදිරිපත් කල යුතුය.

07. එසේ මුද්‍රා තබන ලද ලංසු 2024.10.30 වන දින පෙ.ව. 11.00 ට පෙර වැලිගෙපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ මුද්‍රා තබන ලද පෙට්ටියට ගෙනැවිත් බහාලීම හෝ එම ලංසු ලේඛන ලියාපදංචි තැපෑලෙන් හෝ එවිම කල හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. 2024.10.30 වන දින පෙ.ව. 11.15 ට වැලිගෙපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරු හෝ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

09. ලංසුපත් සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය වැලිගෙපොල ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

10. සියළුම ලංසු 2025.01.29 වන දින දක්වා වලංගු විය යුතුය.

ලේකම්
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව,
ඕපනායක.

2024.10.14